# <u>මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව</u>

## <u>මාධ්‍ය නිවේදනයයි</u>

### <u>මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නාරාහේන්පිට හා වේරහැර කාර්යාල මහජන සේවය සඳහා විවෘත කිරීම</u>

රට තුල උද්ගතව ඇති කොවිඩ් 19 වසංගත තත්ත්වයේ දැඩි අවධානම් ස්වාභාවය මත නාරාහේන්පිට හා වේරහැර කාර්යාලවලින් සපයන මහජන සේවාවන් තාවකාලිකව අත්හිටවනු ලැබුවද, සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් දැඩි පාලනයකින් යුතුව, මහජනතාව වෙනුවෙන් සේවාවන් සැපයීම 2021 මැයි මස 17 වන දින සිට ආරම්භ කරන බව සතුටින් දැනුම් දෙනු ලැබේ.

එමෙන්ම, අවශ්‍ය සේවාවන් ඉටු කර ගැනීමට 0112677877 දුරකථන අංකය ඔස්සේ දිනයක් හා වේලාවක් වෙන් කර ගත යුතු බවද අවධාරණය කරමු.

මේ වන විට, රට තුල සංචරණ සීමා පනවා ඇති හෙයින් වේරහැර සහ නාරාහේන්පිට කාර්යාලවලින් සපයන සේවාවන් ද බස්නාහිර පළාතට පමණක් සීමා වන අතර සංචරණ සීමා ඉවත් කළ පසු සාමාන්‍ය පරිදි සේවාවන් සැපයීම ආරම්භ කරනු ලැබේ.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාලවල කටයුතු අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්ගේ මඟපෙන්වීම මත සිදු කර දෙනු ලැබේ.

වැඩි දුරටත් යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය නම්, කාර්යාල රාජකාරී දිනවල පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වා 0707677877 දුරකථන අංකයට අමතන ලෙසද කාරුණිකව සඳහන් කරමු.

**සුමිත් සී. කේ. අලහකෝන්,**

**මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්,**

**මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව.**